35 වන පිටෙන්




'රෝ' සංවිධානයේ ඒජන්තයෙකු බවට පත්වී සංවිධානයේ නායකයාට විරුද්ධව කටයුතු කළ බවත්, මෙම පිරිස් එම කටයුතුවලට සහයෝගය දී ඇති බවත් චෝදනා පත්‍රයෙන් ප්‍රකාශ විය. ඒ අනුව ඉන්දීය සිරගෙයින් පලා ආ කිරුබන් නැමැත්තාව 'රෝ' සංවිධානය විසින් තම අවශ්‍යතා උදෙසා භාවිතා කරනු ලැබ ඇති බවත්, ඔහු ඉන්දීය සිරගෙයින් පලා ආ බව ප්‍රකාශ කළත් ඇත්තෙන්ම සිදුවී ඇත්තේ ඔහුව 'රෝ' සංවිධානය විසින් නායකයාව මරා දැමීමේ කුමන්ත්‍රණ සැළසුම් සඳහා එවනු ලැබීම බවත්, ඔහු නැවතත් සංවිධානය සමඟ එක්ව කටයුතු කිරීම මාර්ගයෙන් විශ්වාසය දිනාගෙන ඒ මගින් තම සැළැස්ම ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ බවත් එහිදී ප්‍රකාශ විය. නායකතුමාගේ ආහාරයට වස මුසු කිරීම, නායකතුමා ගමන් කරන වාහනයට බෝම්බ සවි කිරීම ආදී කුමන්ත්‍රණවල මාත්තයාගේ දිරි ගැන්වීමෙන් මෙම පිරිස යෙදුණු බව එහිදී පවසන ලදි. අලිමංකඩ සටනේදී දිවි පිදූ මහවිරුවන්ව සැමරුම සඳහා කොඩිකාමම්වල පිහිටුවූ අනුස්මරණ ශාලාව විවෘත කිරීම සඳහා නායකතුමා පැමිණි මොහොතේ නායකතුමාව එම ස්ථානයේ දී ඝාතනය කිරීමට සැළසුමක් සකස්කර තිබුණු බවත්, ඒ සඳහා ආයුධ සූදානම් කර තබාගෙන සිටි බවත්, නමුත් ක්ෂණිකවම නායකතුමා එම අවස්ථාවට සහභාගි නොවීමට ගත් තීරණය හේතුවෙන් එම සැළැස්ම ක්‍රියාත්මක වූවේ නොමැති බවටත් ප්‍රකාශ විය.

**සංවිධානය තුළ සටන්කාමීහු දැඩි පාලනයකට යටත්ව සිටියහ. මුදල් අක්‍රමිකතා, ලිංගික වැරදි යනාදී අපරාධවලට ඉතාමත් ඉහළ දඬුවම වූ මරණ දඬුවම දෙන ලදි.**

කොඩිකාමම් හි පිහිටු වූ අනුස්මරණ ශාලාව විවෘත කිරීමට නායකතුමා පැමිණෙන බවට පුවත සටන්කාමීන් අතරෙහි මහත් උද්දාමයකින් යුතුව කතා බහට ලක්විය. එහෙත් කුමක් හෝ හේතුවක් නිසා අවසන් මොහොතේ පොට්ටුඅම්මාන් පැමිණ එය විවෘත කළ බව මගේ මතකයට නැගිණි.



එම වකවානුවේදී තම පිස්තෝලය සමඟ නායකතුමා හමුවට යාමට බලය තිබුණේ මාත්තයාට පමණි. එහෙයින් අනපේක්ෂිත මොහොතක මාත්තයා තම පිස්තෝලයෙන් නායකතුමාට වෙඩි තබා ඝාතනය කරන බවත්, එහිදී කෝපයට පත්වන කිරුබන් වහාම මාත්තයාට වෙඩි තබා මරණ බවත්, නායකතුමා කෙරෙහි වූ භක්තිය හේතුවෙන් කිරුබන් මාත්තයාව ඝාතනය කිරීම සිදුකළ බවත් විශ්වාස කරන සටන්කාමියෝ කිරුබන් නායකයා ලෙස පිළිගෙන ඔහුගේ යටතේ කටයුතු කිරීමට ඉදිරිපත් වනු ඇතිය යන්න 'රෝ' සංවිධානයේ සැබෑ සැළස්ම වූ බවත් පවසන ලදි. විමුක්ති කොටි සංවිධානය 'රෝ' සංවිධානයේ රූකඩයක් බවට පත් කර ගැනීමට කළ කුමන්ත්‍රණය පරාජය කළ බව එම රැස්වීමේදී ප්‍රකාශ විය.

සංවිධානය තුළ සටන්කාමීහු දැඩි පාලනයකට යටත්ව සිටියහ. මුදල් අක්‍රමිකතා, ලිංගික වැරදි යනාදී අපරාධවලට ඉතාමත් ඉහළ දඬුවම වූ මරණ දඬුවම දෙන ලදි. එහෙත් සංවිධානයේ නියෝජ්‍ය නායකයාව සිටි මාත්තයා තම වගකීම යටතේ සිටින පහළ තනතුරු දැරූ සටන්කාමීන්ට දඬුවම් නොකළ අතර 'ඔයාලගේ වැරදි නායකතුමාට දැනුම් දුන්නොත් වෙන්නේ මොකක්ද කියන එක දන්නවානේ. මම ඔයාලව ආරක්ෂා කරනවා. ඔයාලා මට උදව් කරන්න ඕනෑ.'' යන කොන්දේසිය යටතේ ඔවුන්ව තම අතවැසියන් ලෙස භාවිතා කළ බවටත් පවසන ලදි.

එම රැස්වීමේදී යදම් සහිතව වුන් සිරකරුවන් එක් එක්කෙනා බැගින් නැගිට තමන් විසින් කරන ලද වැරදි පිළිගත්හ. රැස්ව උන් සටන්කාමීහු පිළිම සේ නොසෙල්වී උන්හ. මම ඇත්තෙන්ම සංවිධානය යනු අරමුණ විසින් ඒකාබද්ධ කරන ලද හැඟීම් බර පවුලක් යන අදහසේ උන්නෙමි. එහෙත් මෙවැනි කරුණු දැකගැනීමට ලැබීමත් සමඟම හුස්මක් පවා පිටකළ නොහැකි තරමට බියක් සහ කැලඹීමක් ඇති විය. මා මෙන්ම බොහෝ සටන්කාමීහු ගල් ගැසී සිටිනු මට තේරුම් ගත හැකිවිය. තම හැඟීම් දරාගත නොහැකි සමහර සටන්කාමීහු රහසින් අඬන්නට වූහ. තවත් සමහරු නැගිට චෝදනාවලට ලක්ව සිටින්නන්ට ආක්‍රෝශයෙන් බැණ වැදුණහ. එම කාල වකවානුවේදී සංවිධානයේ සටන්කාමීන් මහත් චිත්තපීඩාවට පත් කිරීමට හේතු වූ සිද්ධියක් බවට එය පත්විය. පොදු ජනතාව අතරෙහි පවා මාත්තයාගේ සිද්ධිය බිය ජනක හැඟීම් ඇති කර තිබුණි. එයට හේතුව ඔහු ජනතාව අතර මහත් විශ්වාසයක් දිනාගෙන සිටීමත්, සංවිධානයෙහි ඉතාමත් දුෂ්කර කාල පරිච්ඡේදයක් තුළදී එහි වර්ධනය උදෙසා මහත් දැඩි වෙහෙසකින් කටයුතු කළ අයෙක් ලෙස ඔහු පිළිබඳව පිළිගැනීමක් තිබීමත්ය.

දේශපාලන අංශය විසින් පවත්වනු ලබන සමකාලීන දේශපාලනය පිළිබඳ සම්මන්ත්‍රණවලදී මාත්තයා පිළිබඳ ප්‍රශ්නය ආශ්‍රිත බොහෝ ප්‍රශ්න ජනතාව විසින් නඟන ලදි. බොහෝ ස්ථානවලදී 'කෝ මාත්තයා ?' යැයි අසමින් ජනතාව කෝපයෙන් වාද කරන්නට වූහ. නායකතුමාට එරෙහිව සිදුකළ කුමන්ත්‍රණයක් හේතුවෙන් ඔහුව සැකපිට අත්අඩංගුවට ගෙන මේ වන විට එය විභාග කෙරෙමින් පවතින බව ජනතාවට පවසන මෙන් අප වෙත පැහැදිලි කිරීම් සිදුකර තිබිණ.

**මතු සම්බන්ධයි**

මෙවර පළ නොවේ




**NAATI Translator**
Sinhalese/English
**සිංහල ඉංග්‍රීසි පරිවර්තන**
(Certificates/Documents for Visa matters)
**Nadie Kammallaweera**
Tel: 0481 179 189
Email: nadiekammallaweera@gmail.com

**Custom Built Kitchens for Affordable Prices**
FREE QUOTE

- NEW KITCHEN OR RENOVATE OLD ONE
- WARDROBE
- PANTRY
- NEW OVER HEAD CUPBOARDS FOR LAUNDRY
මතු සම්බන්ධයි

Auska ROUTING PTY LTD
Fact. 10, 3-11 Bate Close
Pakenham VIC 3810
Ph: 03 5940 4629
Info@auskarouting.com.au
www.auskarouting.com.au
CONTACT
LEELANANDA GALAPPATHTHI 0429 183 974